ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1774/29 - 2012 සැප්තැම්බර් මස 06 වැනි බ්‍රහස්පතින්දා - 2012.09.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### අතුරු ව්‍යවස්ථා

විල්ගමුව ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය (1) වැනි උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තියේ (vii) උපවගන්තියේ උ෴ ඡේදය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව විල්ගමුව ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික) විධි විධාන පනතේ 2 වැනි වගන්තිය (I) (අ) වැනි උප වගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත්, මෙම ගැසට් නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව විල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බල පවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2012 ජූලි මස 06 වැනි දින ,
මහනුවර,
මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

**කුලී රථ වාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1. මෙම අතුරු ව්‍යවස්ථා විල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කුලී රථ නවතා තැබීම, පාලනය කිරීම, විධිමත් කිරීම සහ ගාස්තු අයකර ගැනීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. ප්‍රාදේශීය සභාව විසින් අනුමත කර සභාපතිවරයා විසින් නිවේදනය කරනු ලබන මෙහි පළමු උපලේඛනයේ දැක්වෙන ස්ථානවල හැර වෙනත් කිසිදු පොදු ස්ථානයක මෝටර් රථයක් කුලියට ධාවනයේ යෙදවීමේ අරමුණ ඇතිව නවතා තැබීම නොකළ යුතු ය. සභාවේ යෝජනා සම්මුතියක් මගින් එම ස්ථාන නම් කිරීම කරනු ලැබිය හැකිය.

3. විල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දෙවන අතුරු ව්‍යවස්ථාවට අනුකූලව පළමු උපලේඛනයේ සඳහන් ස්ථානවල දෙවන උපලේඛනයේ දැක්වෙන ගාස්තුවක් සහ ඊට අදාළ රජයේ ගාස්තුත් සභාවට මාසිකව ගෙවීමෙන් එකී ස්ථානවල කුලී රථ වාහන නවතා තැබීම කළ යුතු අතර එම කුලී රථ වාහන සභාවේ ලියාපදිංචි කළ යුතු ය. එම ගාස්තු ද සභාව විසින් කලින් කලට තීරණය කරනු ලැබිය හැකිය. එම සංශෝධිත ගාස්තු ගැසට් පත්‍රයේ පළකිරීමෙන් පසු වලංගු වන්නේය.

1A - PG 1386— 430 (2012/09)

4. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන තැනැත්තෙකුගෙන් ලබාගත් බලපත්‍රය යටතේ හැර කිසිදු තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මෙහි පළමු උපලේඛනයේ දැක්වෙන රථ වාහන නැවතුම්පොළවල මෝටර් රථ වාහන නවතා තැබීම නොකළ යුතු අතර මෙය පෙ.ව. 6.00 සිට ප.ව. 7.00 දක්වා ක්‍රියාත්මක වනු ඇත.

5. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලබන සෑම බල පත්‍රයක්ම සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන තැනැත්තෙකු විසින් හෝ කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස එය නිකුත් කරනු ලැබූයේ එක් ලිත් මාසයක් අවසන් වන දිනයෙන් එහි වලංගු කාලය අවසන් වේ.

6. බලපත්‍රය ලබා ගැනීම සඳහා තුන්වන උපලේඛනයේ ප්‍රකාර විල්ගමුව ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන අයදුම්පත් මගින් සභාපතිවරයා වෙත අයිතිකරු හෝ රියදුරු විසින් අයදුම්කළ යුතු ය.

7. රථ වාහන නවතා තැබීමේ ස්ථානයක නවතා තැබූ වාහනයක් අයිතිකරු හෝ රියදුරු වෙත එම වාහනය සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබූ බලපත්‍රය ඉදිරිපත් කරන ලෙස රථ වාහන පාලකවරයෙකු හෝ එම කාර්යය සඳහා සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියෙකු, පොලිස් නිලධාරියෙකු විසින් ඉල්ලනු ලබන කවර හෝ අවස්ථාවක ඒ අවසර පත්‍රය පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.

8. සෑම මසකම පළමු වැනි දිනට පෙර අදාළ මාසය සඳහා රථ වාහන නවතා තැබීමේ බලපත්‍රය ලබා ගෙන තිබිය යුතු ය.

9. විල්ගමුව ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් නොමැතිව කිසිදු මෝටර් රථයක් නවතා තැබීමේ නැවතුම් පොළකට ඇතුල් කිරීම නොකළ යුතු ය.

10. ස්ථිර වශයෙන් හෝ දින 14 කට නොඅඩු කාලයක් අඛණ්ඩව කුලී රථ වාහන නැවතුම් පොළකින් වාහනයක් ඉවත්කර ගන්නේ නම් ඉවත් කරගත් වහාම ඒ බව ප්‍රාදේශීය සභා කාර්යාලයට දැන්විය යුතු ය. එසේ දැන්වීමක් නොකළ හොත් අදාළ මාසික ගාස්තුව ගෙවිය යුතු ය.

11. කුලී රථ වාහන නැවතුම්පොළ තළදී කිසියම් වාහනයක් අලුත්වැඩියා කිරීම හෝ සේදීම හෝ වෙනත් අයෙකු ලවා සේදීමට සැලැස්වීම හෝ නොකළ යුතු ය.

12. යම් තැනැත්තෙකු කුලී රථ වාහන නවතා තැබීමේ ස්ථානයක හෝ වාහනයක් ඇතුළත හෝ බීමත්ව හෝ අනිසි ලෙස හෝ අශෝබන ලෙස හෝ හැසිරීම හෝ හිරිහැරයක් වන සේ හැසිරීම නොකළ යුතු ය.

13. මෙම අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ විධි විධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩකිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහාම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙළින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය (2) උපවගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

14. නිසි බලය ඇති අධිකරණයක් විසින් නියම කරනු ලැබූ වෙනත් යම් දඬුවමකට සහ හෝ දඩයකට අමතරව මෙම අතුරු ව්‍යවස්ථාව කඩ කිරීම සම්බන්ධයෙන් දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකරු කරනු ලැබූ අයෙකුගේ ලියා පදිංචිය අවලංගු කිරීම නීත්‍යානුකූල වන අතර එසේ අවලංගු කිරීම වෙනුවෙන් කිසිදු වන්දියක් ලැබීමට ඔහුට හිමිකමක් නොමැත්තේ ය.

5. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ,

"සභාව" යන්නෙන් විල්ගමුව ප්‍රාදේශීය සභාව ද,

"සභාපති" යන්නෙන් විල්ගමුව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,

"බලය පවරනු ලැබූ නිලධාරියා" යන්නෙන් විල්ගමුව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියෙකු ද,

"රථ වාහන පාලක" යන්නෙන් විල්ගමුව ප්‍රාදේශීය සභාව විසින් රථවාහන පාලනය කිරීම සඳහා පත් කර සිටින නිලධාරියෙකු අදහස් වේ.

"මෝටර් රථය හෝ කුලී රථය" යන්නෙන් ත්‍රීරෝද රථයක්, ලොරියක්, වෑන් රථයක්, ට්‍රැක්ටරයක්, ට්‍රක් රථයක්, කාර් රථයක්, අත් ට්‍රැක්ටරයක් යනුවෙන් අදහස් කෙරේ.

මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨයෙහි අර්ථ දැක්වෙන අදහස බල පැවැත්වේ.

*පළමු වැනි උපලේඛනය*

1. හීං ගඟ පාලම අසල සිට මාර්ගයේ දකුණු පසින් හෙට්ටිපොල දෙසට අඩි 40ක් දක්වා කොටස ;

2. නුගගොල්ල දියවර ගම්මාන හන්දියේ සිට හසලක දෙසට ප්‍රධාන මාර්ගය දිගේ වම් පස අඩි 75ක කොටස ;

3. විල්ගමුව නිපෝන් හන්දියේ සිට මාර්ගයේ දකුණු දෙසින් නිපෝන් පාලම දෙසට අඩි 100ක කොටස ;

4. හෙට්ටිපොල නරගයේ බස් නැවතුම් පොළ ඉදිරිපිට අඩි 50ක කොටස ;

5. හෙට්ටිපොල නගරයේ බස් නැවතුම් පොළට පිටුපස බෝධිය අසල අඩි 40ක කොටස ;

6. දේවගිරිය හංදියේ සිට මාර්ගයේ වම් පසින් හදුන්ගමුව දෙසට අඩි 50ක කොටස ;

7. හඳුන්ගමුව 3 ඇල හන්දියේ සිට හෙට්ටිපොල දෙසට මාර්ගයේ දකුණු පස අඩි 80ක කොටස ;

8. මාරක රෝහල හංදියේ සිට රෝහල දෙසට මාර්ගයේ වම් පස අඩි 75ක කොටස.

9. ගුරුවෙළයාය සොහොන් පිටිය අසල සිට මාර්ගයේ දකුණු පස හෙට්ටිපොල දෙසට අඩි 100ක කොටස.

*දෙවැනි උපලේඛනය*

*කුලී රථ නවතා තැබීමේ මාසික ගාස්තු*

| | | |
|---|---|---|
| 01. | ලොරියක් සඳහා | රු. 50.00 මසකට |
| 02. | වෑන් රථයක් සඳහා | රු. 50.00 මසකට |
| 03. | බස් රථයක් සඳහා | රු. 50.00 මසකට |
| 04. | ත්‍රිරෝද රථයක් සඳහා | රු. 50.00 මසකට |
| 05. | මෝටර් රථයක් සඳහා | රු. 50.00 මසකට |
| 06. | වෙනත් බර වාහන සඳහා | රු. 50.00 මසකට |

*තුන්වැනි උපලේඛනය*

**විල්ගමුව ප්‍රාදේශීය සභාව**

වාහන ලියාපදිංචිය සඳහා බලපත්‍ර ලබා ගැනීම සඳහා අයදුම්පත

01. වාහනයේ අංකය සහ වර්ගය : ——————.

02. අයිතිකරුගේ නම : ——————.

03. හැඳුනුම්පත් අංකය : ——————.

04. අයිතිකරුගේ ලිපිනය : ——————.

05. රියදුරාගේ හැඳුනුම්පත් අංකය : ——————.

06. රියදුරු බලපත්‍ර අංකය : ——————.

07. රියදුරුගේ ලිපිනය : —————.

08. වාහනය නවතා තැබීමට ඉල්ලන ස්ථානය : —————.

09. වාහනය පාවිච්චි කළ හැක්කේ කුමන කාර්යයක් සඳහා ද : —————.

10. එහි ධාරිතාව - ප්‍රමාණය : —————.

11. බලපත්‍ර ගාස්තු (රු.) : —————.

ඉහත තොරතුරු නිවැරැදි සහ සත්‍ය බවට සහතික කරමි.

දිනය : ............................................ ..........................................................................
අයදුම්කරුගේ / රියදුරුගේ අත්සන.

සභාපතිතුමාගේ නිර්දේශය : අනුමත කරමි/අනුමත නොකරමි.

දිනය : ............................................ ................................................................
සභාපති.

09 - 613/1

**මහ නගර සභා බල ප්‍රදේශය තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා පහත දැක්වෙන කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා ඉහත කී වගන්තිය යටතේ මෙසේ ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඉහත කී කෙටුම්පත් අතුරු ව්‍යවස්ථාවේ අඩංගු විධිවිධාන ඇතුළත් කර අතුරු ව්‍යවස්ථාවක් සෑදීමට හා මහ නගර සභා ආඥා පනතේ (252 වැනි අධිකාරිය) 272 වැනි වගන්තිය මගින් බලය ලැබී ඇති මහ නගර සභාවලට 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු ඉහත කී 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ 3 වැනි උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, එම පනතට අනුකූලව අතුරු ව්‍යවස්ථා වැළඳ ගැනීමට අමතරව අනුමැතිය දෙනු ලැබේ.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා
පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2012 ජුනි මස 18 වැනි දින ,
මහනුවර,
මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

1. මෙම අතුරු ව්‍යවස්ථා මහ නගර සභා බල ප්‍රදේශය තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් බෝවීම වැළැක්වීම හා විනාශ කිරීම මඟින් බල ප්‍රදේශයේ පාරිසරික තත්ත්වය වැඩි දියුණු කිරීම සහ බෝවන රෝග පැතිරයාම වැළැක්වීම සඳහා වූ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මහ නගර සභා ප්‍රදේශය තුළ කිසියම් තැනැත්තෙකු විසින් කිසිදු පරිශ්‍රයක මදුරුවන් සහ රෝග කාරක කෘමීන් බෝවීම ඒවා වර්ධනය වීමට තුඩු දෙන පරිදි කටයුතු කිරීම හෝ කරවීම හෝ එසේ වීමට ඉඩ හැරීම හෝ නොකළ යුතු ය.

3. මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම සඳහා මහ නගර සභා බල ප්‍රදේශයේ සෑම පදිංචිකරුවකුම -

(i) සියලු නොවැසූ ටින්, බෝතල්, පෙට්ටි, ප්ලාස්ටික් කෑන්, ටයර්, පොල්කටු, පොල් කෝම්බ සහ ඒ ස්ථානයේ ඇති වෙනත් යම් ජලය රඳා පැවතිය හැකි භාණ්ඩ, ද්‍රව්‍ය හා භාජන ආදිය ඉවත් කරවීමට හෝ විනාශ කර දැමීමට සැලැස්විය යුතු ය ;

(ii) නේවාසික හෝ නේවාසික නොවන ගොඩනැගිලිවල වැහි පිහිලි, පහතට වැටෙන පයිප්ප සහ ගෙවතුවල ඇති කානුවල ජලය බැස යාම ක්‍රමවත්ව පවත්වාගෙන යා යුතු ය. ඒවායේ අවහිරකම් නිරන්තරයෙන් පරීක්ෂා කර බලා ඉවත් කළ යුතු ය ;

(iii) නේවාසික හෝ නේවාසික නොවන පරිශ්‍ර තුළ ඇති සියලුම ජල බඳුන්, ටැංකි සහ ජලය එක්රැස් කරන වෙනත් භාජන මනා තත්වයකින් යුතුව හා කාලීන ප්‍රතිසංස්කරණයන් සහිතව පවත්වාගෙන යාම ද, ඒවා මදුරුවන් සහ රෝග කාරක කෘමීන් බෝවීම වැළැක්වෙන තත්වයකින් තබා ගැනීම ද, මදුරුවන් සහ රෝග කාරක කෘමීන් බෝවීම වැළැක්වීම සඳහා අවශ්‍ය විය හැකි කටයුතු කිරීම ද කළ යුතු ය ;

(iv) පරිශ්‍රය තුළ ඇති සියලුම ළිං යහපත් තත්වයෙන් පවත්වාගෙන යා යුතු අතර, මදුරුවන් හා රෝග කාරක කෘමීන් බෝවීම වැළැක්වන තත්වයෙන් තබා ගැනීමට අවශ්‍ය කටයුතු සැලැස්විය යුතු ය ;

(v) හිස් කිරීමට හැකිවන ආකාරයෙන් සාදා ඇති යම් කෘතිම පොකුණක් වේ නම්, එය යටත් පිරිසෙයින් සතියකට එක් වරක්වත් හිස්කොට පවිත්‍ර කළ යුතු ය ;

(vi) ගෙවතුවල හා ඉඩම්වල ඇති කාණු වලින් බැසයන ජලය එකතු වීමෙන් දියකඩිති සෑදීම වැළැක්වීම සඳහා ඒවා නිතිපතා නඩත්තු කළ යුතු ය ;

(vii) ආහාර පිණිස හෝ අලංකාරය සඳහා වවනු ලබන පැළෑටි හැර අනෙකුත් සියලු ලඳු කැලෑ, වගා සහ වෘක්ෂලතා ආදිය මනුෂ්‍ය වාසස්ථානයන් වශයෙන් භාවිතා කරන යම් ගොඩනැගිල්ලක හෝ ඉදිකිරීමක සිට මීටර් 5ක් ඇතුළත වූ සෑම කොටසකින්ම ඉවත් කරනු ලැබිය යුතු ය ;

(viii) සියලු ගල්වලවල්, මැණික් ගැරූ වලවල්, මැටි වලවල් හෝ වෙනත් ඕනෑම කරුණක් සඳහා තනන ලද වලවල් ඒවායේ වතුර එකතුවීම වළක්වන ආකාරයට පවත්වාගෙන යා යුතු ය ;

(ix) ජලය රැඳිය හැකි ගොඩබිම වැවෙන විසිතුරු පැළෑටි. දිය පරඬැල්, පෙඳපාසි, තෙල්පාසි, බරවා පාසි, ඇතුළත් ජලජ පැළෑටි හා මදුරුවන් හා රෝග කාරක කෘමීන් බෝවීමට ඉඩකඩ සලසන බව කලින් කල දැන ගන්නට ලැබෙන වෙනත් යම් පැළෑටියක් හෝ පැළෑටි ඉවත් කොට විනාශ කර දැමිය යුතු අතර, එකී පැළෑටි යම් දියමාර්ගයක් දිගේ පාවීයාම නවත්වන පරිදි සුදුසු බාධක ඉදිකිරීමෙන් ඒවා පැතිරයාම වළක්වාලිය යුතු ය ;

(x) වැසිකිලි, දියවලවල්, දිය උරන වලවල්. මුද්‍රා තැබූ වලවල් හා ඒවාගේ වටපිටාව ද ඇතුලුව ඒ ස්ථානයේ ඇති සියලු වැසිකිලි මදුරුවන් වළක්වන තත්වයෙන් පවත්වාගෙන යා යුතු ය ;

(xi) සුසාන භූමි හෝ වෙනත් පරිශ්‍රයන්හි මලවුන් සඳහා ඉදිකෙරෙන සිහිවටන ජලය නොරැඳෙන අයුරින් ඉදි කිරීමට කටයුතු කල යුතු,ය.

4. මහ නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා විසින් හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙන ලද යම් නිලධාරියකු විසින් ඕනෑම දිනයක පෙ.ව. 6.00 සිට ප.ව. 6.00 ඇතුළත යම් වේලාවක දී යම් පරිශ්‍රයකට ඇතුල් වී පහත දැක්වෙන කරුණු සහතික කර ගැනීම පිණිස ඒ පරිශ්‍රය පරීක්ෂා කර බැලීම නීත්‍යානුකූල වන්නේ ය.

(i) ඒ පරිශ්‍රය මදුරුවන් හා කෘමීන් බෝවන පරිශ්‍රයක් ද යන වග ;

(ii) ඒ පරිශ්‍රයේ පදිංචිකරුවන් අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන පිළිපැද තිබේ ද යන වග ;

(iii) ඒ පරිශ්‍රයේ මදුරුවන් බෝවීම වැළැක්වීම සඳහා සහ විනාශ කිරීම සඳහා යම් පියවරක් ගැනීමට අවශ්‍ය වේ නම් එම පියවර කවරේ ද යන වග ;

(iv) ඒ පරිශ්‍රයේ කෘමි නාශක ඉසීම සාර්ථක ලෙස කර තිබේ ද යන වග.

5. (i) නාගරික කොමසාරිස් විසින් හෝ ඔහු විසින් තත්කාර්යය සඳහා ලිඛිතව බලය දෙන ලද යම් නිලධාරියකු විසින් යම් පරිශ්‍රයක අවශ්‍යවේ යැයි සළකනු ලබන පරීක්ෂණයකින් පසු එකී පරිශ්‍රයේ මදුරුවන් හෝ රෝග කාරක කෘමීන් විනාශ කිරීමට හා වර්ධනය වීම මැඩ පැවැත්වීමට ඉටු කළ යුතු කාර්යයන් ලිඛිත දැන්වීමකින් ඒ පරිශ්‍රයේ අයිතිකරුට හෝ පදිංචිකරුට හෝ නියම කරනු ලැබිය හැකිය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ දැන්වීමක් බාරදෙන ලද යම් පරිශ්‍රයක අයිතිකරු විසින් හෝ පදිංචිකරු විසින් ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කාලය තුලදී එකී නියමයන් ඉටු කරනු ලැබිය යුතුය.

6. (i) නාගරික කොමසාරිස්ගේ ලිඛිත අනුමැතිය නොමැතිව යම් පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු එහි යම් ළිඳක් තැනීම හෝ ටැංකියක්, පොකුණක්, ජල භාජනයක්, වතුර මලක් හෝ වතුරු එක්රැස්විය හැකි හෝ වතුර රඳවා තබන වෙනත් ව්‍යුහයක් ඉදිකිරීම නොකළ යුතුය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදයේ සඳහන් විධිවිධානවලට පටහැනි වන සේ යම් ඉදිකිරීමක් කරනු ලැබූ අවස්ථාවක, නාගරික කොමසාරිස් විසින් එම ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු වෙත භාරදෙනු ලබන ලිඛිත දැන්වීමක් මගින් එම දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලැබූ කාලයක් තුළදී ළිඳ, ටැංකිය, පොකුණ, ජල භාජනය, වතුර මල හෝ ව්‍යුහය නියම කරනු ලබන ද්‍රව්‍යයෙන් පුරවා වසා දමන ලෙස හෝ අන්‍යාකාරයකින් විනාශකර දමන ලෙස නැතහොත් ඒ කාලය ඇතුළත ඒ දැන්වීමේ සඳහන් කර ඇති ආකාරයට එය වෙනස් කරන ලෙස නියම කළ හැකිය.

7. (i) 5 වන හෝ 6 වන අතුරු ව්‍යවස්ථා යටතේ වූ දැන්වීමක් යම් පරිශ්‍රයක අයිතිකරුට හෝ පදිංචිකරුට පෞද්ගලිකව භාරදීම හෝ එම දැන්වීම එකී ස්ථානයේ හොඳින් පෙනෙන තැනක ඇලවීමෙන් හෝ භාරදෙනු ලැබිය හැකිය.

(ii) යම් පරිශ්‍රයක හවුල් අයිතිකරුවන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් විසින් හවුලේ අධිවසයන අවස්ථාවක එම අයිතිකරුවන්ගෙන් එක් එක් අයිතිකරුවෙකු 7 (1) වන අතුරු ව්‍යවස්ථාව සහ 5 වන අතුරු ව්‍යවස්ථාව යටතේ ඔවුන් අතරින් යම් අයෙකුට භාරදෙනු ලබන යම් දැන්වීමක නියමයන් ඉටු කිරීම සම්බන්ධ යම් පැහැර හැරීමකට හෝ ඉටු නොකර සිටීමකට පොදුවේ සහ වෙන් වෙන්ව වගකිව යුතු ය.

(iii) 5 වන හෝ 6 වන අතුරු ව්‍යවස්ථාව යටතේ දැන්වීමක් භාරදෙනු ලැබූ යම් පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු විසින් එම දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කාලය තුළ ඒ දැන්වීමේ නියමයන් ඉටු කිරීම පැහැර හරින ලද අවස්ථාවක, නාගරික කොමසාරිස් විසින් හෝ ඒ දැන්වීම නිකුත් කරන ලද නිලධාරියා විසින් හෝ තත්කාර්ය සඳහා නාගරික කොමසාරිස් විසින් බලය පවරන ලද වෙනත් යම් නිලධාරියෙකු විසින් ඕනෑම දිනයක පෙ.ව. 6.00 සිට ප.ව. 6.00 අතර වේලාවක අවශ්‍ය විය හැකි සහායකයින් සහ සේවකයින් සමඟ එකී පරිශ්‍රයට ඇතුල් වී ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කාර්යයන් ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කිරීමට සැළැස්වීම කරනු ලැබිය හැකිය.

(iv) යම් පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු වෙත 5 වන 6 වන සහ 7 වන අතුරු ව්‍යවස්ථා යටතේ භාරදෙන ලද දැන්වීමක නිශ්චිතව සඳහන් යම් කාර්යයක් හෝ කාර්යයන් නාගරික කොමසාරිස් විසින් හෝ බලය පවරනු ලැබූ නිලධාරියෙකු විසින් ක්‍රියාත්මක කළ විට හෝ ඉටුකල විට ඒ කාර්යය හෝ කාර්යයන් ක්‍රියාත්මක කිරීමෙහි ලා දරන්නට සිදුවූ වියදම් ප්‍රමාණය එකී ස්ථානයේ අයිතිකාරයා හෝ පදිංචිකාරයා විසින් මහ නගර සභාව වෙත ගෙවිය යුතුය. නාගරික කොමසාරිස් සිය අත්සන යටතේ ඒ පිළිබඳ ලියවිල්ලකින් කරනු ලබන ඉල්ලීමකින් පසු දින 14ක් ඇතුළත එම මුදල අයිතිකරු හෝ පදිංචිකරු විසින් මහ නගර සභාවට ගෙවනු ලැබිය යුතු දඩ මුදලක් ලෙස ඒ අයිතිකරුගෙන් හෝ පදිංචිකරුගෙන් අය කර ගනු ලැබීම නීත්‍යානුකූල වන්නේය.

8. මෙම අතුරු ව්‍යවස්ථාවල යම් විධිවිධානයක් උල්ලංඝනය කිරීම වරදක් වන අතර, යම් තැනැත්තෙක් මහෙස්ත්‍රාත් අධිකරණය මඟින් වරදකරුවකු කරනු ලැබූ විට රුපියල් හත්සිය පනහකට නොවැඩි දඩයකට යටත් විය යුතු අතර උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසියපනහකට නොවැඩි අතිරේක දඩයකට ද යටත්විය යුතුය.

9. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම අතුරු ව්‍යවස්ථාවල :

"අයිතිකරු" යන්නෙන් යම් අයිතිකරුවෙකු සහ බදුකරුවෙකු ද යම් පරිශ්‍රයක කුලියට හෝ එළදාවට කවර හෝ ආකාරයක අයිතියකට හිමිකම් ඇති යම් තැනැත්තෙකු ද

"පදිංචිකරු" යන්නෙන් යම් පරිශ්‍රයක පදිංචිව සිටින්නා වූ හෝ තවත් අයෙකු වෙනුවෙන් නියෝජිතයකු වශයෙන් හෝ එහි භාරකාරත්වය කළමනාකරණය හෝ පාලනය දරන තැනැත්තෙකු ද

"බලයලත් නිලධාරියා" යන්නෙන් නාගරික කොමසාරිස් විසින් ලිඛිතව බලය පවරනු ලැබූ එම සභාවේ යම් නිලධාරියෙකු හෝ සේවකයෙකු ද

"සභාව" යන්නෙන් මහා නගර සභාව ද

"නාගරික කොමසාරිස්" යන්නෙන් අදාළ මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයාද

"රෝගකාරක කෘමීන් යන්නෙන්" මදුරුවන් සහ රෝග බෝ කරන වෙනත් කෘමීන් අදහස් වේ.

"පරිශ්‍රය" යන්නෙන් යම් ඉඩමක්, නිවසක්, ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක්, පාවිච්චි කරනු ලබන හෝ අත්හැර දමන ලද ළිදක්, නැවක්, කන්ටේනරයක් හෝ අත්හැර දමන ලද වාහනයක් ඇතුලත් වන අතර යම් පොකුණක්, ටැංකියක්, වැවක ජල මාර්ගයක, කාණුවක හා ගඟක නිම්නයද අදහස් වේ.

09 - 613/2

**නගර සභා බල ප්‍රදේශය තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා පහත දැක්වෙන කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා ඉහත කී වගන්තිය යටතේ මෙසේ ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඉහත කී කෙටුම්පත් අතුරු ව්‍යවස්ථාවේ අඩංගු විධිවිධාන ඇතුළත් කර අතුරු ව්‍යවස්ථාවක් සෑදීමට හා නගර සභා ආඥා පනතේ (252 වන අධිකාරිය) 157 වගන්තිය මඟින් බලය ලැබී ඇති නගර සභාවලට 1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු ඉහත කී 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ 3 වන උප වගන්තියේ විධිවිධාන වලට යටත්ව, එම පනතට අනුකූලව අතුරු ව්‍යවස්ථා වැළඳ ගැනීමට අමතරව අනුමතිය දෙනු ලැබේ.

සරත් ඒකනායක.
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා
පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2012 ජුනි මස 18 වැනි දින ,
මහනුවර,
මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

1. මෙම අතුරු ව්‍යවස්ථා නගර සභා බල ප්‍රදේශය තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් බෝවීම වැළැක්වීම හා විනාශ කිරීම මඟින් බල ප්‍රදේශයේ පාරිසරික තත්වය වැඩි දියුණු කිරීම සහ බෝවන රෝග පැතිරයාම වැළැක්වීම සඳහා වූ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. නගර සභා ප්‍රදේශය තුළ කිසියම් තැනැත්තෙකු විසින් කිසිදු පරිශ්‍රයක මදුරුවන් සහ රෝග කාරක කෘමීන් බෝවීම ඒවා වර්ධනය වීමට තුඩු දෙන පරිදි කටයුතු කිරීම හෝ කරවීම හෝ එසේ වීමට ඉඩ හැරීම හෝ නොකල යුතුය.

3. මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම සඳහා නගර සභා බල ප්‍රදේශයේ සෑම පදිංචිකරුවකුම

(i) සියලු නොවැසූ ටින්, බෝතල්, පෙට්ටි, ප්ලාස්ටික් කෑන්, ටයර්, පොල්කඳු, පොල් කෝම්බ සහ ඒ ස්ථානයේ ඇති වෙනත් යම් ජලය රඳා පැවතිය හැකි භාණ්ඩ, ද්‍රව්‍ය හා භාජන ආදිය ඉවත් කරවීමට හෝ විනාශ කර දැමීමට සැලැස්විය යුතුය ;

(ii) නේවාසික හෝ නේවාසික නොවන ගොඩනැගිලිවල වැහි පිහිලි, පහතට වැටෙන පයිප්ප සහ ගෙවතුවල ඇති කානුවල ජලය බැස යාම ක්‍රමවත්ව පවත්වාගෙන යා යුතුය. ඒවායේ අවහිරකම් නිරන්තරයෙන් පරීක්ෂා කර බලා ඉවත් කළ යුතුය ;

(iii) නේවාසික හෝ නේවාසික නොවන පරිශ්‍ර තුළ ඇති සියලුම ජල බඳුන්, ටැංකි සහ ජලය එක්රැස් කරන වෙනත් භාජන මනා තත්වයකින් යුතුව හා කාලීන ප්‍රතිසංස්කරණයන් සහිතව පවත්වාගෙන යාම ද ඒවා මදුරුවන් සහ රෝග කාරක කෘමීන් බෝවීම වැළැක්වෙන තත්වයකින් තබා ගැනීම ද මදුරුවන් සහ රෝග කාරක කෘමීන් බෝවීම වැළැක්වීම සඳහා අවශ්‍ය විය හැකි කටයුතු කිරීම ද කළ යුතුය ;

(iv) පරිශ්‍රය තුළ ඇති සියලුම ළිං යහපත් තත්වයෙන් පවත්වාගෙන යා යුතු අතර, මදුරුවන් හා රෝග කාරක කෘමීන් බෝවීම වැළැක්වන තත්වයෙන් තබා ගැනීමට අවශ්‍ය කටයුතු සැලැස්විය යුතුය ;

(v) හිස් කිරීමට හැකිවන ආකාරයෙන් සාදා ඇති යම් කෘතිම පොකුණක් වේ නම්, එය යටත් පිරිසෙයින් සතියකට එක් වරක්වත් හිස්කොට පවිත්‍ර කළ යුතුය ;

(vi) ගෙවතුවල හා ඉඩම්වල ඇති කාණු වලින් බැසයන ජලය එකතු වීමෙන් දියකඩිති සෑදීම වැළැක්වීම සඳහා ඒවා නිතිපතා නඩත්තු කළ යුතුය ;

(vii) ආහාර පිණිස හෝ අලංකාරය සඳහා වවනු ලබන පැළෑටි හැර අනෙකුත් සියළු ලඳු කැලෑ, වගා සහ වෘක්ෂලතා ආදිය මනුෂ්‍ය වාසස්ථානයන් වශයෙන් භාවිතා කරන යම් ගොඩනැගිල්ලක හෝ ඉදිකිරීමක සිට මීටර් 5ක් ඇතුළත වූ සෑම කොටසකින්ම ඉවත් කරනු ලැබිය යුතුය ;

(viii) සියළු ගල්වලවල්, මැණික් ගැරූ වලවල්. මැටි වලවල් හෝ වෙනත් ඕනෑම කරුණක් සඳහා තනන ලද වලවල් ඒවායේ වතුර එකතුවීම වළක්වන ආකාරයට පවත්වාගෙන යා යුතුය ;

(ix) ජලය රැඳිය හැකි ගොඩබිම වැවෙන විසිතුරු පැළෑටි. දිය පරඬැල්, පෙඳපාසි, තෙල්පාසි, බරවා පාසි, ඇතුළත් ජලජ පැළෑටි හා මදුරුවන් හා රෝග කාරක කෘමීන් බෝවීමට ඉඩකඩ සලසන බව කලින් කල දැන ගන්නට ලැබෙන වෙනත් යම් පැළෑටියක් හෝ පැළෑටි ඉවත් කොට විනාශ කර දැමිය යුතු අතර, එකී පැළෑටි යම් දියමාර්ගයක් දිගේ පාවීයාම නවත්වන පරිදි සුදුසු බාධක ඉදිකිරීමෙන් ඒවා පැතිරයාම වළක්වාලිය යුතු ය ;

(x) වැසිකිලි, දියවලවල්, දිය උරන වලවල්. මුද්‍රා තැබූ වලවල් හා ඒවාගේ වටපිටාව ද ඇතුලුව ඒ ස්ථානයේ ඇති සියලු වැසිකිලි මදුරුවන් බෝවීම වළක්වන තත්වයෙන් පවත්වාගෙන යා යුතුය ;

(xi) සුසාන භූමි හෝ වෙනත් පරිශ්‍රයන්හි මලවුන් සඳහා ඉදිකෙරෙන සිහිවටන ජලය නොරැඳෙන අයුරින් ඉදි කිරීමට කටයුතු කළ යුතුය.

4. නගර සභාවේ සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙන ලද යම් නිලධාරියකු විසින් හෝ ඕනෑම දිනයක පෙ.ව. 6.00 සිට ප.ව. 6.00 ඇතුළත යම් වේලාවකදී යම් පරිශ්‍රයකට ඇතුල් වී පහත දැක්වෙන කරුණු සහතික කර ගැනීම පිණිස ඒ පරිශ්‍රය පරීක්ෂා කර බැලීම නීත්‍යානුකූල වන්නේය.

(i) ඒ පරිශ්‍රය මදුරුවන් හා කෘමීන් බෝවන පරිශ්‍රයක්ද යන වග ;

(ii) ඒ පරිශ්‍රයේ පදිංචිකරුවන් අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන පිළිපැද තිබේද යන වග ;

(iii) ඒ පරිශ්‍රයේ මදුරුවන් බෝවීම වැළැක්වීම සඳහා සහ විනාශ කිරීම සඳහා යම් පියවරක් ගැනීමට අවශ්‍ය වේ නම් එම පියවර කවරේද යන වග ;

(iv) ඒ පරිශ්‍රයේ කෘමි නාශක ඉසීම සාර්ථක ලෙන කර තිබේද යන වග.

5. (i) සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් තත්කාර්යය සඳහා ලිඛිතව බලය දෙන ලද යම් නිලධාරියකු විසින් යම් පරිශ්‍රයක අවශ්‍යවේ යැයි සළකනු ලබන පරීක්ෂණයකින් පසු එකී පරිශ්‍රයේ මදුරුවන් හෝ රෝග කාරග කෘමීන් විනාශ කිරීමට හා වර්ධනය වීම මැඩ පැවැත්වීමට ඉටු කළ යුතු කාර්යයන් ලිඛිත දැන්වීමකින් ඒ පරිශ්‍රයේ අයිතිකරුට හෝ පදිංචිකරුට හෝ නියම කරනු ලැබිය හැකිය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ දැන්වීමක් බාරදෙන ලද යම් පරිශ්‍රයක අයිතිකරු විසින් හෝ පදිංචිකරු විසින් ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කාලය තුළදී එකී නියමයන් ඉටු කරනු ලැබිය යුතුය.

6. (i) සභාපතිවරයාගේ ලිඛිත අනුමැතිය නොමැතිව යම් පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු එහි යම් ළිඳක් තැනීම හෝ ටැංකියක්, පොකුණක්, ජල භාජනයක්, වතුර මලක් හෝ වතුර එක්රැස්විය හැකි හෝ වතුර රඳවා තබන වෙනත් ව්‍යුහයක් ඉදිකිරීම නොකළ යුතුය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදයේ සඳහන් විධිවිධානවලට පටහැනි වන සේ යම් ඉදිකිරීමක් කරනු ලැබූ අවස්ථාවක, සභාපති විසින් එම ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු වෙත භාරදෙනු ලබන ලිඛිත දැන්වීමක් මගින් එම දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලැබූ කාලයක් තුළදී ළිඳ, ටැංකිය, පොකුණ, ජල භාජනය, වතුර මල හෝ ව්‍යුහය නියම කරනු ලබන ද්‍රව්‍යයෙන් පුරවා වසා දමන ලෙස හෝ අන්‍යාකාරයකින් විනාශකර දමන ලෙස නැතහොත් ඒ කාලය ඇතුළත ඒ දැන්වීමේ සඳහන් කර ඇති ආකාරයට එය වෙනස් කරන ලෙස නියම කළ හැකිය.

7. (i) 5 වැනි හෝ 6 වැනි අතුරු ව්‍යවස්ථා යටතේ වූ දැන්වීමක් යම් පරිශ්‍රයක අයිතිකරුට හෝ පදිංචිකරුට පෞද්ගලිකව භාරදීම හෝ එම දැන්වීම එකී ස්ථානයේ හොඳින් පෙනෙන තැනක ඇලවීමෙන් හෝ භාරදෙනු ලැබිය හැකිය.

(ii) යම් පරිශ්‍රයක හවුල් අයිතිකරුවන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් විසින් හවුලේ අධිවසයන අවස්ථාවක එම අයිතිකරුවන්ගෙන් එක් එක් අයිතිකරුවෙකු 7 (1) වන අතුරු ව්‍යවස්ථාව සහ 5 වන අතුරු ව්‍යවස්ථාව යටතේ ඔවුන් අතරින් යම් අයෙකුට භාරදෙනු ලබන යම් දැන්වීමක නියමයන් ඉටු කිරීම සම්බන්ධ යම් පැහැර හැරීමකට හෝ ඉටු නොකර සිටීමකට පොදුවේ සහ වෙන් වෙන්ව වගකිව යුතුය.

(iii) 5 වැනි හෝ 6 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ දැන්වීමක් භාරදෙනු ලැබූ යම් පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු විසින් එම දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කාලය තුළ ඒ දැන්වීමේ නියමයන් ඉටු කිරීම පැහැර හරින ලද අවස්ථාවක, සභාපතිවරයා විසින් හෝ ඒ දැන්වීම නිකුත් කරන ලද නිලධාරියා විසින් හෝ තත්කාර්ය සඳහා සභාපතිවරයා විසින් බලය පවරන ලද වෙනත් යම් නිලධාරියෙකු විසින් ඕනෑම දිනයක පෙ.ව. 6.00 සිට ප.ව. 6.00 අතර වේලාවක අවශ්‍ය විය හැකි සහායකයින් සහ සේවකයින් සමඟ එකී පරිශ්‍රයට ඇතුල් වී ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කාර්යයන් ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කිරීමට සැළැස්වීම කරනු ලැබිය හැකිය.

(iv) යම් පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු වෙත 5 වැනි 6 වැනි සහ 7 වැනි අතුරු ව්‍යවස්ථා යටතේ භාරදෙන ලද දැන්වීමක නිශ්චිතව සඳහන් යම් කාර්යයක් හෝ කාර්යයන් සභාපතිවරයා විසින් හෝ බලය පවරනු ලැබූ නිලධාරියෙකු විසින් ක්‍රියාත්මක කළ විට හෝ ඉටුකළ විට ඒ කාර්යය හෝ කාර්යයන් ක්‍රියාත්මක කිරීමෙහි ලා දරන්නට සිදුවූ වියදම් ප්‍රමාණය එකී ස්ථානයේ අයිතිකාරයා හෝ පදිංචිකාරයා විසින් නගර සභාව වෙත ගෙවිය යුතුය. සභාපතිවරයා සිය අත්සන යටතේ ඒ පිළිබඳ ලියවිල්ලකින් කරනු ලබන ඉල්ලීමකින් පසු දින 14ක් ඇතුළත එම මුදල අයිතිකරු හෝ පදිංචිකරු විසින් නගර සභාවට ගෙවනු ලැබිය යුතු දඩ මුදලක් ලෙස ඒ අයිතිකරුගෙන් හෝ පදිංචිකරුගෙන් අය කර ගනු ලැබීම නීත්‍යානුකූල වන්නේය.

8. මෙම අතුරු ව්‍යවස්ථාවල යම් විධිවිධානයක් උල්ලංඝනය කිරීම වරදක් වන අතර, යම් තැනැත්තෙක් මහේස්ත්‍රාත් අධිකරණය මඟින් වරදකරුවකු කරනු ලැබූ විට රුපියල් හත්සිය පනහකට නොවැඩි දඩයකට යටත් විය යුතු අතර උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසියපනහකට නොවැඩි අතිරේක දඩයකට ද යටත්විය යුතුය.

9. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම අතුරු ව්‍යවස්ථාවල :

"අයිතිකරු" යන්නෙන් යම් අයිතිකරුවෙකු සහ බදුකරුවෙකු ද යම් පරිශ්‍රයක කුලියට හෝ එළදාවට කවර හෝ ආකාරයක අයිතියකට හිමිකම් ඇති යම් තැනැත්තෙකු ද ;

"පදිංචිකරු" යන්නෙන් යම් පරිශ්‍රයක පදිංචිව සිටින්නා වූ හෝ තවත් අයෙකු වෙනුවෙන් නියෝජිතයකු වශයෙන් හෝ එහි භාරකාරත්වය කළමනාකරණය හෝ පාලනය දරන තැනැත්තෙකු ද ;

"බලයලත් නිලධාරියා" යන්නෙන් සභාපතිවරයා විසින් ලිඛිතව බලය පවරනු ලැබූ එම සභාවේ යම් නිලධාරියෙකු හෝ සේවකයෙකු ද ;

"සභාව" යන්නෙන් නගර සභාව ද ;

"සභාපතිවරයා" යන්නෙන් අදාළ නගර සභාවේ සභාපතිවරයාද ;

"රෝගකාරක කෘමීන් යන්නෙන්" මදුරුවන් සහ රෝග බෝ කරන වෙනත් කෘමීන් අදහස් වේ.

"පරිශ්‍රය" යන්නෙන් යම් ඉඩමක්, නිවසක්, ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක්, පාවිච්චි කරනු ලබන හෝ අත්හැර දමන ලද ළිඳක්, නැවක්, කන්ටේනරයක් හෝ අත්හැර දමන ලද වාහනයක් ඇතුළත් වන අතර යම් පොකුණක්, ටැංකියක්, වැවක ජල මාර්ගයක, කාණුවක හා ගඟක නිම්නය ද අදහස් වේ.

09 - 613/3

**ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා පහත දැක්වෙන කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා ඉහත කී වගන්තිය යටතේ මෙසේ ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඉහත කී කෙටුම්පත අතුරු ව්‍යවස්ථාවේ අඩංගු විධිවිධාන ඇතුළත් කර අතුරු ව්‍යවස්ථාවක් සෑදීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වැනි වගන්තිය මගින් බලය ලැබී ඇති ප්‍රාදේශීය සභාවලට 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු ඉහත කී 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තියේ විධිවිධාන වලට යටත්ව, එම පනතට අනුකූලව අතුරු ව්‍යවස්ථා වැළඳ ගැනීමට අමතරව අනුමතිය දෙනු ලැබේ.

සරත් ඒකනායක.
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා
පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2012 ජුනි මස 18 වැනි දින ,
මහනුවර,
මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

1. මෙම අතුරු ව්‍යවස්ථා ප්‍රදේශීය සභා බල ප්‍රදේශය තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් බෝවීම වැළැක්වීම හා විනාශ කිරීම මඟින් බල ප්‍රදේශයේ පාරිසරික තත්වය වැඩි දියුණු කිරීම සහ බෝවන රෝග පැතිරයාම වැළැක්වීම සඳහා වූ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ කිසියම් තැනැත්තෙකු විසින් කිසිදු පරිශ්‍රයක මදුරුවන් සහ රෝග කාරක කෘමීන් බෝවීම ඒවා වර්ධනය වීමට තුඩු දෙන පරිදි කටයුතු කිරීම හෝ කරවීම හෝ එසේ වීමට ඉඩ හැරීම හෝ නොකළ යුතුය.

3. මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම සඳහා ප්‍රාදේශීය නරග සභා බල ප්‍රදේශයේ සෑම පදිංචිකරුවකුම :

(i) සියලු නොවැසූ ටින්, බෝතල්, පෙට්ටි, ප්ලාස්ටික් කෑන්, ටයර්, පොල්කබු, පොල් කෝම්බ සහ ඒ ස්ථානයේ ඇති වෙනත් යම් ජලය රඳා පැවතිය හැකි භාණ්ඩ, ද්‍රව්‍ය හා භාජන ආදිය ඉවත් කරවීමට හෝ විනාශ කර දැමීමට සැලැස්විය යුතුය ;

(ii) නේවාසික හෝ නේවාසික නොවන ගොඩනැගිලිවල වැහි පිහිලි, පහතට වැටෙන පයිප්ප සහ ගෙවතුවල ඇති කානුවල ජලය බැස යාම ක්‍රමවත්ව පවත්වාගෙන යා යුතුය. ඒවායේ අවහිරකම් නිරන්තරයෙන් පරීක්ෂා කර බලා ඉවත් කළ යුතුය ;

(iii) නේවාසික හෝ නේවාසික නොවන පරිශ්‍ර තුළ ඇති සියලුම ජල බඳුන්, ටැංකි සහ ජලය එක්රැස් කරන වෙනත් භාජන මනා තත්වයකින් යුතුව හා කාලීන ප්‍රතිසංස්කරණයන් සහිතව පවත්වාගෙන යාම ද ඒවා මදුරුවන් සහ රෝග කාරක කෘමීන් බෝවීම වැළැක්වෙන තත්වයකින් තබා ගැනීම ද මදුරුවන් සහ රෝග කාරක කෘමීන් බෝවීම වැළැක්වීම සඳහා අවශ්‍ය විය හැකි කටයුතු කිරීම ද කළ යුතුය ;

(iv) පරිශ්‍රය තුළ ඇති සියලුම ළිං යහපත් තත්වයෙන් පවත්වාගෙන යා යුතු අතර, මදුරුවන් හා රෝග කාරක කෘමීන් බෝවීම වැළැක්වන තත්වයෙන් තබා ගැනීමට අවශ්‍ය කටයුතු සැලැස්විය යුතුය ;

(v) හිස් කිරීමට හැකිවන ආකාරයෙන් සාදා ඇති යම් කෘතිම පොකුණක් වේ නම්, එය යටත් පිරිසෙයින් සතියකට එක් වරක්වත් හිස්කොට පවිත්‍ර කළ යුතුය ;

(vi) ගෙවතුවල හා ඉඩම්වල ඇති කාණු වලින් බැසයන ජලය එකතු වීමෙන් දියකඩිති සෑදීම වැළැක්වීම සඳහා ඒවා නිතිපතා නඩත්තු කළ යුතුය ;

(vii) ආහාර පිණිස හෝ අලංකාරය සඳහා වවනු ලබන පැළෑටි හැර අනෙකුත් සියළු ලඳු කැලෑ, වගා සහ වෘක්ෂලතා ආදිය මනුෂ්‍ය වාසස්ථානයන් වශයෙන් භාවිතා කරන යම් ගොඩනැගිල්ලක හෝ ඉදිකිරීමක සිට මීටර් 5ක් ඇතුළත වූ සෑම කොටසකින්ම ඉවත් කරනු ලැබිය යුතුය ;

(viii) සියලු ගල්වලවල්, මැණික් ගැරු වලවල්, මැටි වලවල් හෝ වෙනත් ඕනෑම කරුණක් සඳහා තනන ලද වලවල් ඒවායේ වතුර එකතුවීම වළක්වන ආකාරයට පවත්වාගෙන යා යුතු ය ;

(ix) ජලය රැඳිය හැකි ගොඩබිම වැවෙන විසිතුරු පැළෑටි,. දිය පරඬැල්, පෙඳපාසි, තෙල්පාසි, බරවා පාසි, ඇතුළත් ජලජ පැළෑටි හා මදුරුවන් හා රෝග කාරක කෘමීන් බෝවීමට ඉඩකඩ සලසන බව කලින් කල දැන ගන්නට ලැබෙන වෙනත් යම් පැළෑටියක් හෝ පැළෑටි ඉවත් කොට විනාශ කර දැමිය යුතු අතර, එකී පැළෑටි යම් දියමාර්ගයක් දිගේ පාවීයාම නවත්වන පරිදි සුදුදු බාධක ඉදිකිරීමෙන් ඒවා පැතිරයාම වළක්වාලිය යුතු ය ;

(x) වැසිකිලි, දියවලවල්, දිය උරන වලවල්, මුද්‍රා තැබූ වලවල් හා ඒවාගේ වටපිටාව ද ඇතුළුව ඒ ස්ථානයේ ඇති සියලු වැසිකිලි මදුරුවන් වළක්වන තත්වයෙන් පවත්වාගෙන යා යුතු ය ;

(xi) සුසාන භූමි හෝ වෙනත් පරිශ්‍රයන්හි මලවුන් සඳහා ඉදිකෙරෙන සිහිවටන ජලය නොරැඳෙන අයුරින් ඉදිකිරීමට කටයුතු කළ යුතු ය.

4. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙන ලද යම් නිලධාරියකු විසින් ඕනෑම දිනයක පෙ.ව. 6.00 සිට ප.ව. 6.00 ඇතුළත යම් වේලාවකදී යම් පරිශ්‍රයකට ඇතුල් වී පහත දැක්වෙන කරුණු සහතික කර ගැනීම පිණිස ඒ පරිශ්‍රය පරීක්ෂා කර බැලීම නීත්‍යානුකූල වන්නේය.

(i) ඒ පරිශ්‍රය මදුරුවන් හා කෘමීන් බෝවන පරිශ්‍රයක්ද යන වග ;

(ii) ඒ පරිශ්‍රයේ පදිංචිකරුවන් අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන පිළිපැද තිබේද යන වග ;

(iii) ඒ පරිශ්‍රයේ මදුරුවන් බෝවීම වැළැක්වීම සඳහා සහ විනාශ කිරීම සඳහා යම් පියවරක් ගැනීමට අවශ්‍ය වේ නම් එම පියවර කවරේද යන වග ;

(iv) ඒ පරිශ්‍රයේ කෘමි නාශක ඉසීම සාර්ථක ලෙස කර තිබේද යන වග.

5. (i) සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් තත්කාර්යය සඳහා ලිඛිතව බලය දෙන ලද යම් නිලධාරියෙකු විසින් යම් පරිශ්‍රයක අවශ්‍යවේ යැයි සලකනු ලබන පරීක්ෂණයකින් පසු එකී පරිශ්‍රයේ මදුරුවන් හෝ රෝග කාරක කෘමීන් විනාශ කිරීමට හා වර්ධනය වීම මැඩ පැවැත්වීමට ඉටු කළ යුතු කාර්යයන් ලිඛිත දැන්වීමකින් ඒ පරිශ්‍රයේ අයිතිකරුට හෝ පදිංචිකරුට හෝ නියම කරනු ලැබිය හැකිය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (I) වැනි ඡේදය යටතේ දැන්වීමක් බාරදෙන ලද යම් පරිශ්‍රයක අයිතිකරු විසින් හෝ පදිංචිකරු විසින් ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කාලය තුළදී එකී නියමයන් ඉටු කරනු ලැබිය යුතු ය.

6. (i) සභාපතිවරයාගේ ලිඛිත අනුමැතිය නොමැතිව යම් පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු එහි යම් ළිඳක් තැනීම හෝ ටැංකියක්, පොකුණක්, ජල භාජනයක්, වතුර මලක් හෝ වතුරු එක්රැස්විය හැකි හෝ වතුර රඳවා තබන වෙනත් ව්‍යුහයක් ඉදිකිරීම නොකළ යුතු ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (I) වැනි ඡේදයේ සඳහන් විධිවිධානවලට පටහැනි වන සේ යම් ඉදිකිරීමක් කරනු ලැබූ අවස්ථාවක, සභාපතිවරයා විසින් එම ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු වෙත භාරදෙනු ලබන ලිඛිත දැන්වීමක් මගින් එම දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලැබූ කාලයක් තුළදී ළිඳ, ටැංකිය, පොකුණ, ජල භාජනය, වතුර මල හෝ ව්‍යුහය නියම කරනු ලබන ද්‍රව්‍යයෙන් පුරවා වසා දමන ලෙස හෝ අන්‍යාකාරයකින් විනාශකර දමන ලෙස නැතහොත් ඒ කාලය ඇතුළත ඒ දැන්වීමේ සඳහන් කර ඇති ආකාරයට එය වෙනස් කරන ලෙස නියම කළ හැකිය.

7. (i) 5 වැනි හෝ 6 වැනි අතුරු ව්‍යවස්ථා යටතේ වූ දැන්වීමක් යම් පරිශ්‍රයක අයිතිකරුට හෝ පදිංචිකරුට පෞද්ගලිකව භාරදීම හෝ එම දැන්වීම එකී ස්ථානයේ හොඳින් පෙනෙන තැනක ඇලවීමෙන් හෝ භාරදෙනු ලැබිය හැකිය.

(ii) යම් පරිශ්‍රයක හවුල් අයිතිකරුවන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් විසින් හවුලේ අධිවසයන අවස්ථාවක එම අයිතිකරුවන්ගෙන් එක් එක් අයිතිකරුවෙකු 7 (I) වැනි අතුරු ව්‍යවස්ථාව සහ 5 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඔවුන් අතරින් යම් අයෙකුට භාරදෙනු ලබන යම් දැන්වීමක නියමයන් ඉටු කිරීම සම්බන්ධ යම් පැහැර හැරීමකට හෝ ඉටු නොකර සිටීමකට පොදුවේ සහ වෙන් වෙන්ව වගකිය යුතු ය.

(iii) 5 වැනි හෝ 6 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ දැන්වීමක් භාරදෙනු ලැබූ යම් පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු විසින් එම දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කාලය තුළ ඒ දැන්වීමේ නියමයන් ඉටු කිරීම පැහැර හරින ලද අවස්ථාවක, සභාපතිවරයා විසින් හෝ ඒ දැන්වීම නිකුත් කරන ලද නිලධාරියා විසින් හෝ තත්කාර්ය සඳහා නාගරික සභාපතිවරයා විසින් බලය පවරන ලද වෙනත් යම්

නිලධාරියෙකු විසින් ඕනෑම දිනයක පෙ.ව. 6.00 සිට ප.ව. 6.00 අතර වේලාවක අවශ්‍ය විය හැකි සහායකයින් සහ සේවකයින් සමඟ එකී පරිශ්‍රයට ඇතුල් වී ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කාර්යයන් ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කිරීමට සැලැස්වීම කරනු ලැබිය හැකිය.

(iv) යම් පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු වෙත 5 වැනි 6 වැනි සහ 7 වන අතුරු ව්‍යවස්ථා යටතේ භාරදෙන ලද දැන්වීමක නිශ්චිතව සඳහන් යම් කාර්යයක් හෝ කාර්යයන් සභාපතිවරයා විසින් හෝ බලය පවරනු ලැබූ නිලධාරියෙකු විසින් ක්‍රියාත්මක කළ විට හෝ ඉටුකළ විට ඒ කාර්යය හෝ කාර්යයන් ක්‍රියාත්මක කිරීමෙහි ලා දරන්නට සිදුවූ වියදම් ප්‍රමාණය එකී ස්ථානයේ අයිතිකාරයා හෝ පදිංචිකාරයා විසින් නගර සභාව වෙත ගෙවිය යුතු ය. සභාපතිවරයා සිය අත්සන යටතේ ඒ පිළිබඳ ලියවිල්ලකින් කරනු ලබන ඉල්ලීමකින් පසු දින 14ක් ඇතුළත එම මුදල අයිතිකරු හෝ පදිංචිකරු විසින් නගර සභාවට ගෙවනු ලැබිය යුතු දඩ මුදලක් ලෙස ඒ අයිතිකරුගෙන් හෝ පදිංචිකරුගෙන් අය කර ගනු ලැබීම නීත්‍යානුකූල වන්නේය.

8. මෙම අතුරු ව්‍යවස්ථාවල යම් විධිවිධානයක් උල්ලංඝනය කිරීම වරදක් වන අතර, යම් තැනැත්තෙක් මහෙස්ත්‍රාත් අධිකරණය මඟින් වරදකරුවකු කරනු ලැබූ විට රුපියල් හත්සිය පනහකට නොවැඩි දඩයකට යටත් විය යුතු අතර උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසියපනහකට නොවැඩි අතිරේක දඩයකට ද යටත්විය යුතු ය.

9. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම අතුරු ව්‍යවස්ථාවල :

"අයිතිකරු" යන්නෙන් යම් අයිතිකරුවෙකු සහ බදුකරුවෙකු ද යම් පරිශ්‍රයක කුලියට හෝ එළදාවට කවර හෝ ආකාරයක අයිතියකට හිමිකම් ඇති යම් තැනැත්තෙකු ද ;

"පදිංචිකරු" යන්නෙන් යම් පරිශ්‍රයක පදිංචිව සිටින්නා වූ හෝ තවත් අයෙකු වෙනුවෙන් නියෝජිතයෙකු වශයෙන් හෝ එහි භාරකාරත්වය කළමනාකරණය හෝ පාලනය දරන තැනැත්තෙක් ද ;

"බලයලත් නිලධාරියා" යන්නෙන් සභාපතිවරයා විසින් ලිඛිතව බලය පවරනු ලැබූ එම සභාවේ යම් නිලධාරියෙකු හෝ සේවකයෙකු ද ;

"සභාව" යන්නෙන් ප්‍රාදේශීය සභාව ද ;

"සභාපතිවරයා" යන්නෙන් අදාළ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාද ;

"රෝගකාරක කෘමීන් යන්නෙන්" මදුරුවන් සහ රෝග බෝ කරන වෙනත් කෘමීන් අදහස් වේ.

"පරිශ්‍රය" යන්නෙන් යම් ඉඩමක්, නිවසක්, ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක්, පාවිච්චි කරනු ලබන හෝ අත්හැර දමන ලද ළිඳක්, නැවක්, කන්ටේනරයක් හෝ අත්හැර දමන ලද වාහනයක් ඇතුළත් වන අතර යම් පොකුණක්, ටැංකියක්, වැවක, ජල මාර්ගයක, කාණුවක හා ගඟක නිම්නයද අදහස් වේ.

09 - 613/4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.